91651

AL/2006/21 S-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2006 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2006 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2006

ආර්ථික විද්‍යාව II (I කොටස)
பொருளியல் II (பகுதி I)
Economics II (Part I)

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

විභාග අංකය : ..............................

සැලකිය යුතුයි :

- ❋ මෙම කොටසේ ප්‍රශ්න **20** ක් ඇත. ඒ සියලු ම ප්‍රශ්න අනිවාර්ය වේ.
- ❋ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් ලැබෙන අතර, මුළු කොටසට ලකුණු **40** ක් හිමි වේ.
- ❋ මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සැපයිය යුතුයි.
- ❋ එක් බහුවරණ ප්‍රශ්නයකට ඇත්තේ එක් නිවැරදි පිළිතුරක් පමණි. එම පිළිතුර හඳුනාගෙන පිළිතුරට යටින් ඉරක් අඳින්න.
- ❋ නියමිත කාලය අවසන් වූ විට I හා II කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා ශාලාධිපතිට භාර දිය යුතුයි.

---

1. මූල්‍ය ප්‍රතිපත්තිය යනු,
   (i) මිල ගණන් සහ ආදායම් සෘජුව පාලනය කිරීමට අදාළ වන ප්‍රතිපත්තියකි.
   (ii) බදු අය කිරීම හා රාජ්‍ය වියදම් පාලනය කිරීමට අදාළ වන ප්‍රතිපත්තියකි.
   (iii) පොලී අනුපාතික සහ මුදල් සැපයුම පාලනය කිරීමට අදාළ වන ප්‍රතිපත්තියකි.
   (iv) රාජ්‍ය අයවැය ලේඛනය කළමනාකරණය කිරීමට අදාළ වන ප්‍රතිපත්තියකි.
   (v) විදේශ විනිමය අනුපාතිකය සඳහා අදාළ වන ප්‍රතිපත්තියකි.

2. මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම ඉහළ නැංවීමෙහිලා වැඩියෙන් ම දායක වී ඇත්තේ පහත සඳහන් කරුණු අතුරෙන් කවරක් ද?
   (i) බැංකු ණය වැඩිවීම
   (ii) අපනයන වැඩිවීම
   (iii) පොලී අනුපාතික ඉහළ යාම
   (iv) ඛනිජ තෙල් මිල ඉහළ යාම
   (v) රුපියලේ බාහිර අගය ඉහළ යාම

3. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නැංවනු ලැබුවහොත්,
   (i) බැංකුවලට ණය දීම වැඩි කිරීමට සිදුවනු ඇත.
   (ii) මුදල් සැපයුම අඩුවනු ඇත.
   (iii) මුදල් සැපයුම ඉහළ යනු ඇත.
   (iv) වට්ටම් අනුපාතිකය ඉහළ යනු ඇත.
   (v) බැංකුවලට ඉල්ලුම් තැන්පතු ඉහළනංවා ගැනීමට හැකිවනු ඇත.

4. මහ බැංකුව විසින් රජයේ සුරකුම්පත් මිලදී ගනු ලබන විට,
   (i) සංචිත මුදල් හෙවත් අධි බලැති මුදල් වැඩි වේ.
   (ii) සංචිත මුදල් හෙවත් අධි බලැති මුදල් අඩු වේ.
   (iii) ඉල්ලුම් තැන්පතු අඩු වේ.
   (iv) පොලී අනුපාතික ඉහළයයි.
   (v) මුදල් සැපයුම අඩු වේ.


www.pastpaperlk.com www.artsapi.lk

[ 2 වැනි පිටුව බලන්න.

5. උද්ධමනය යනු,
   (i) සාමාන්‍ය මිල මට්ටමේ අඛණ්ඩ ඉහළ යාමයි.
   (ii) සාමාන්‍ය මිල මට්ටමේ අඛණ්ඩ පහළ වැටීමයි.
   (iii) පාරිභෝගික මිල දර්ශකය වෙනස්වන සීඝ්‍රතාවයයි.
   (iv) පාරිභෝගික මිල දර්ශකය ඉහළ යන සීඝ්‍රතාවයයි.
   (v) මුදලේ ක්‍රය ශක්තිය වෙනස්වන සීඝ්‍රතාවයයි.

6. කිසියම් රටක නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 50 ක් සහ මුදල් තොගය රුපියල් බිලියන 20 ක් වේ යැයි උපකල්පනය කළහොත් මුදලේ සංසරණ ප්‍රවේගය,
   (i) 0.4 කි.
   (ii) 2.5 කි.
   (iii) 3.0 කි.
   (iv) 4.0 කි.
   (v) 7.0 කි.

7.




ජපානය (JJ) සහ කොරියාව (KK) යන රටවල් දෙක සඳහා කල්පිත නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර දෙකක් ඉහත ප්‍රස්තාර සටහන පෙන්නුම් කරයි.
ප්‍රවාහන පිරිවැය හෝ වෙළෙඳ බාධක කිසිවක් නොමැති යයි උපකල්පනය කරනු ලැබුවහොත්,
   (i) රෙදිපිළි හා සහල් යන භාණ්ඩ වර්ග දෙකම පිළිබඳ ව නිරපේක්ෂ වාසියක් කොරියාවට ඇත.
   (ii) කිසිදු රටකට වෙළෙඳමෙන් වාසියක් ලබාගත නොහැක.
   (iii) රෙදිපිළි හා සහල් යන භාණ්ඩ වර්ග දෙක ම පිළිබඳ ව සාපේක්ෂ වාසියක් ජපානයට ඇත.
   (iv) රටවල් දෙකටම වෙළෙඳමෙන් වාසි ලබා ගත හැක.
   (v) ජපානය කොරියාවට සහල් අපනයනය කරනු ඇත.

8. වර්තමානයේ ශ්‍රී ලංකාවේ වඩා වැදගත් අපනයන වෙළෙඳ පොළ වනුයේ,
   (i) ඇමෙරිකා එක්සත් ජනපදයයි.
   (ii) ජපානයයි.
   (iii) ඉන්දියාවයි.
   (iv) එක්සත් රාජධානියයි.
   (v) ජර්මනියයි.

9. ශ්‍රී ලංකාවට වෙළෙඳ අනුපාතය අවාසිදායක විය හැක්කේ,
   (i) අපනයන පරිමාව ආනයන පරිමාවට වඩා වේගයෙන් වැඩි වන විට ය.
   (ii) ආනයන පරිමාව අපනයන පරිමාවට වඩා වේගයෙන් වැඩිවන විට ය.
   (iii) අපනයන මිල ආනයන මිලට වඩා වේගයෙන් ඉහළ යන විට ය.
   (iv) ආනයන මිල අපනයන මිලට වඩා වේගයෙන් ඉහළ යන විට ය.
   (v) අපනයන ඉපයුම් ආනයන වියදමට වඩා වේගයෙන් වැඩිවන විට ය.

10. කිරිඟු නිෂ්පාදනයෙහිලා කියුබාවට වඩා නිරපේක්ෂ වාසියක් කැනඩාවට තිබේ නම්,
   (i) කියුබාවට වඩා වැඩියෙන් කිරිඟු නිෂ්පාදනය කිරීමට කැනඩාවට හැකිවනු ඇත.
   (ii) කිරිඟු සඳහා කැනඩාවෙහි ඉහළ මිලක් පවතිනු ඇත.
   (iii) කිරිඟු සඳහා කියුබාවෙහි ඉහළ මිලක් පවතිනු ඇත.
   (iv) කියුබාවට වඩා අඩු සම්පත් ප්‍රමාණයකින් කිරිඟු ඒකකයක් නිෂ්පාදනය කිරීමට කැනඩාවට හැකි වනු ඇත.
   (v) කිරිඟු නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය කියුබාවට වඩා කැනඩාවේ අඩු ය.

[ 3 වැනි පිටුව බලන්න.

www.pastpaperlk.com
www.artsapi.lk

11. ජපානයේ යෙන් මුදලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රුපියලෙහි වටිනාකමේ වැඩිවීමක් සිදු වුවහොත්,
   (i) ජපන් භාණ්ඩ මිල දී ගැනීම සඳහා ශ්‍රී ලාංකිකයන්ට වැඩිපුර රුපියල් අවශ්‍ය වනු ඇත.
   (ii) විදේශ විනිමය වෙළෙඳ පොළේ දී එක් රුපියලක් සඳහා ශ්‍රී ලාංකිකයන්ට ලැබෙනුයේ අඩු යෙන් ප්‍රමාණයකි.
   (iii) ජපන් ජාතිකයන්ට ශ්‍රී ලාංකික භාණ්ඩ මිලදී ගැනීම පෙරට වඩා ලාභදායක වනු ඇත.
   (iv) ජපන් ජාතිකයන්ට ශ්‍රී ලාංකික භාණ්ඩ පෙරට වඩා මිල අධික වනු ඇත.
   (v) විනිමය වෙළෙඳ පොළෙහි යෙන් මුදල් සැපයුම් වක්‍රය දකුණට විතැන් වනු ඇත.

12. සංවර්ධනය වන රටක් කෙටි කාලීනව තම ව්‍යවහාර මුදලේ බාහිර වටිනාකම පහළ වැටීමේ අර්බුදයකට මුහුණ දෙනු ලැබුවහොත්, වඩාත් පහසුවෙන් ඒ සඳහා පිළිසරණක් ලබා ගැනීමට හැකිවන්නේ පහත සඳහන් ආයතන අතුරෙන් කවර ආයතනයකින් ද?
   (i) ලෝක බැංකුව (WB)
   (ii) ලෝක වෙළෙඳ සංවිධානය (WTO)
   (iii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
   (iv) ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය සඳහා වන සංවිධානය (OECD)
   (v) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)

13. පහත සඳහන් දෑ අතුරෙන් ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමට ඇතුළු නොවන්නේ කුමක් ද?
   (i) විදේශ විනිමය සංචිතය
   (ii) ඒකපාර්ශ්වීය සංක්‍රාම
   (iii) සේවා අපනයන
   (iv) ආයෝජන ආදායම් ලැබීම්
   (v) ආයෝජන ආදායම් ගෙවීම්

14. කිසියම් රටක ගෙවුම් ශේෂ ලේඛනයකින් තෝරා ගත් දත්ත කිහිපයක් පහත සඳහන් වගුව පෙන්නුම් කරයි.

| ගෙවුම් ශේෂ අයිතමය | රුපියල් බිලියන |
|---|---|
| අපනයන | 540 |
| ආනයන | 620 |
| ශුද්ධ සේවා | 80 |
| ශුද්ධ ආදායම් | - 200 |
| ශුද්ධ වර්තන සංක්‍රාම | 140 |
| සමස්ත ශේෂය | 110 |

ඉහත සඳහන් දත්තවලට අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (i) වෙළෙඳ ශේෂයෙහි රුපියල් බිලියන 80 ක අතිරික්තයක් පවතී.
   (ii) ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුමෙහි රුපියල් බිලියන 170 ක අතිරික්තයක් පවතී.
   (iii) වර්තන ගිණුමෙහි රුපියල් බිලියන 120 ක හිඟයක් පවතී.
   (iv) ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමෙහි රුපියල් බිලියන 170 ක හිඟයක් පවතී.
   (v) වෙළෙඳ ශේෂයෙහි රුපියල් බිලියන 120 ක හිඟයක් පවතී.

15. සංවර්ධනය වන රටක ආර්ථිකයේ ද්විත්ව ස්වරූපය වශයෙන් සළකනුයේ,
   (i) සම්ප්‍රදායික අංශය හා නූතන අංශය අතර අනුකලනයක් දක්නට නොතිබීමයි.
   (ii) ධනවතුන් හා දුප්පතුන් අතර පවත්නා අති විශාල පරතරයයි.
   (iii) පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනයෙහි ලා කරනු ලබන ආයෝජනය හා ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයෙහි ලා කරනු ලබන ආයෝජනය අතර පවත්නා විෂමතාවයි.
   (iv) පරිභෝජනය හා ආයෝජනය අතර පවත්නා විෂමතාවයි.
   (v) අපනයනාභිමුඛ හා ආනයන ආදේශන කාර්මීකරණය අතර පවත්නා වෙනසයි.

16. 1950 ට පසුව මේ දක්වා ශ්‍රී ලංකාව විසින් අත්කරගෙන ඇති ඉහළම ආර්ථික වෘද්ධි වේගය වනුයේ,
   (i) 9.6% කි.
   (ii) 9.0% කි.
   (iii) 8.2% කි.
   (iv) 6.9% කි.
   (v) 6.7% කි.

www.pastpaperlk.com www.artsapi.lk

[ 4 වැනි පිටුව බලන්න.

17. දෙන ලද අවස්ථාවක් සඳහා කල්පිත ආර්ථිකයක ජනගහනය හා ශ්‍රම හමුදවට අදළ දත්ත සමහරක් පහත සඳහන් වගුව පෙන්නුම් කරයි.

| ජනගහනය (මිලියන) | වයස අවුරුදු 10 හා ඊට වැඩි ජනගහනය (මිලියන) | සේවා නියුක්ත ප්‍රමාණය (මිලියන) | සේවා වියුක්ත ප්‍රමාණය (මිලියන) |
|---|---|---|---|
| 50 | 25 | 15 | 5 |

පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මෙම ආර්ථිකය සඳහා නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(i) සහභාගිත්ව අනුපාතිකය 50% ක් සහ විරැකියා අනුපාතිකය 20% කි.
(ii) සහභාගිත්ව අනුපාතිකය 40% ක් සහ විරැකියා අනුපාතිකය 20% කි.
(iii) සහභාගිත්ව අනුපාතිකය 60% ක් සහ විරැකියා අනුපාතිකය 25% කි.
(iv) සහභාගිත්ව අනුපාතිකය 60% ක් සහ විරැකියා අනුපාතිකය 20% කි.
(v) සහභාගිත්ව අනුපාතිකය 80% ක් සහ විරැකියා අනුපාතිකය 25% කි.

18. "ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයෙහි දැඩි විෂමතාවක් පවතී." උදහරණයක් වශයෙන් 2003 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් බස්නාහිර පළාතේ පමණක් දයකත්වය,
(i) 35% කි.
(ii) 38% කි.
(iii) 40% කි.
(iv) 46% කි.
(v) 49% කි.

19. සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමෙහිලා ශ්‍රී ලංකාව දනටමත් පහත සඳහන් එක් ක්ෂේත්‍රයක් සඳහා අදළ ප්‍රමාණාත්මක ඉලක්ක බොහෝ දුරට සපුරා ඇත. එම ක්ෂේත්‍රය වනුයේ,
(i) දැඩි දරිද්‍රතාව සහ කුසගින්න පිටුදැකීමයි.
(ii) සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබා දීමයි.
(iii) ළමා මර්ත්‍යතාව පහළ හෙළීමයි.
(iv) පාරිසරික තිරසරභාවය සහතික කිරීමයි.
(v) සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගිතාව වර්ධනය කිරීමයි.

20. පහත සඳහන් දෑ අතුරෙන් ගෝලීයකරණයේ ප්‍රතිවිපාකයක් පෙන්නුම් කරනුයේ කවරක් විසින් ද?
(i) ලෝක ආර්ථිකයන්හි විශාල දුරස්වීමක් සිදුවී ඇත.
(ii) සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර ආදායම් පරතරය වැඩිවෙමින් පවතී.
(iii) ශ්‍රම, භාණ්ඩ හා මුදල් වෙළෙඳ පොළ පිළිබඳ පාලනයන් හා තහංචි වැඩි වී තිබේ.
(iv) ලෝකයේ නව කාර්මික රටවල වේගවත් ආර්ථික වෘද්ධියක් හටගෙන ඇති අතර විදේශ වෙළෙඳමේ වැඩිවීමක් සිදුවී නොමැත.
(v) ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය පහළ වැටී ඇත.

* *

www.pastpaperlk.com www.artsapi.lk

91990

AL/2006/21-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 21 | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2006 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2006 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2006

ආර්ථික විද්‍යාව II (II කොටස)
பொருளியல் II (பகுதி II)
Economics II (Part II)

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

අයදුම්කරුවන්ට උපදෙස් :

※ "අ" උප කොටසින් ප්‍රශ්න දෙකක් ද,
"ආ" උප කොටසින් ප්‍රශ්න දෙකක් ද, තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## "අ" කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

1. එක්තරා කල්පිත ආර්ථික ක්‍රමයක මුදල් සැපයුම රුපියල් බිලියන 110 ක් බවත්, එයින් රුපියල් බිලියන 10 ක් මහජනතාව සතු ව්‍යවහාර මුදල් බවත්, ඉතිරි රුපියල් බිලියන 100 බැංකු තැන්පතු බවත් සිතන්න. මෙම ආර්ථිකයේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% කි. එබැවින් බැංකු පද්ධතිය සතුව ව්‍යවහාර මුදල් රුපියල් බිලියන 10 ක් හා රුපියල් බිලියන 90 ක ණය ප්‍රමාණයක් පවතී.

(අ) තැන්පතු ගුණකයේ අගය කොපමණ ද? (ලකුණු 03 යි.)

(ආ) මහ බැංකුව සංචිත අනුපාතය 25% ක් දක්වා ඉහළ නංවන බවත්, මහජනතාව සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණයේ කිසිදු වෙනසක් සිදු නොවන බවත්, වාණිජ බැංකු අධි සංචිත පවත්වා නොගන්නා බවත් උපකල්පනය කරමින්

(i) බැංකු වත්කම් හා වගකීම්වල අළුත් අගයන් ගණනය කරන්න. (ලකුණු 04 යි.)

(ii) මුදල් සැපයුම ගණනය කරන්න. (ලකුණු 02 යි.)

(ඉ) සංචිත අනුපාතය 5% දක්වා පහළ හෙළනු ලැබුවහොත් (ආ) කොටසේ (i) හා (ii) ට ලැබෙන නව අගයන් ගණනය කරන්න. (ලකුණු 06 යි.)

2. (අ) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ද්‍රවශීල වත්කම් වශයෙන් සැලකෙන ප්‍රධාන දෑ ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05 යි.)

(ආ) මූල්‍ය ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය ආර්ථිකය මත පතුරුවා හරිනු ලබන ප්‍රධාන මාර්ග කවරේ ද? (ලකුණු 05 යි.)

(ඉ) "පුළුල් නිර්වචනයට අනුව ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම (M2b) 2004 වර්ෂයේ දී 19.6% කින් වැඩිවිය." මුදල් සැපයුමේ හටගත් මෙම වර්ධනයට බලපෑ හේතු කවරේ ද? (ලකුණු 05 යි.)

3. (අ) ඇමෙරිකා එක්සත් ජනපදයෙහි සහ කැනඩාවෙහි තිරිඟු සහ රෙදි නිෂ්පාදනයට අදාළ පිරිවැය දත්ත සමහරක් පහත සඳහන් වගුව පෙන්නුම් කරයි. ඒවා ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**එක් ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍යවන ශ්‍රම පැය සංඛ්‍යාව**

| භාණ්ඩය | ඇමෙරිකා එක්සත් ජනපදය | කැනඩාව |
|---|---|---|
| තිරිඟු | 2 | 1 |
| රෙදි | 6 | 5 |

(i) ඇමෙරිකා එක්සත් ජනපදයේ සහ කැනඩාවේ තිරිඟු නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය කොපමණ ද? (ලකුණු 04 යි.)

(ii) තිරිඟු සහ රෙදි නිෂ්පාදනය පිළිබඳ ව නිරපේක්ෂ වාසි ඇත්තේ කිනම් රටකට ද? (ලකුණු 02 යි.)

(iii) තිරිඟු සහ රෙදි නිෂ්පාදනය පිළිබඳ ව සාපේක්ෂ වාසි ඇති රටවල් මොනවා ද? (ලකුණු 02 යි.)

(iv) තිරිඟු සහ රෙදි නිෂ්පාදනයෙහිලා විශේෂ ප්‍රාගුණ්‍යය කළ යුතු රටවල් මොනවා ද? (ලකුණු 02 යි.)

(ආ) "ගෝලීයකරණයට පක්ෂව අදහස් දක්වන අය යෝජනා කරනුයේ ගෝලීයකරණය තුළින් සංවර්ධිත සහ සංවර්ධනය වන රටවල් දෙකොටසටම ප්‍රතිලාභ සැලසෙන බව ය." මෙම අදහස සමඟ ඔබ එකඟ වන්නෙහි ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 05 යි.)

[ 2 වැනි පිටුව බලන්න.

www.pastpaperlk.com
www.artsabi.lk

4. (අ) "අභ්‍යන්තර සමතුලිතතාව" හා "බාහිර සමතුලිතතාව" අතර වෙනස දක්වන්න. *(ලකුණු 04 යි.)*

(ආ) ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ අන්තර්ගත ප්‍රධාන සංරචක කවරේ ද? *(ලකුණු 04 යි.)*

(ඉ) ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක් කරා නැවත යාමෙන් ඇතිවිය හැකි වාසි සහ අවාසි කවරේ ද? *(ලකුණු 04 යි.)*

(ඊ) "විශේෂ ගැණුම් හිමිකම්" (SDR) යනුවෙන් කුමක් අදහස්වේ ද? වි.ගැ.හි. (SDR) ඒකකයක වටිනාකම තීරණය වනුයේ කෙසේ ද? *(ලකුණු 03 යි.)*

## "ආ" කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

5. (අ) "ආදායම් දරිද්‍රතාව" සහ "මානව දරිද්‍රතාව" යන සංකල්ප අතර වෙනස දක්වන්න. *(ලකුණු 04 යි.)*

(ආ) 1977 ට පසුව ශ්‍රී ලංකාවේ කුටුම්බ ආදායම් ව්‍යාප්තිය පිළිබඳ ගිනි සංගුණකයේ උපනති පරීක්ෂා කරන්න. *(ලකුණු 04 යි.)*

(ඉ) "නිරපේක්ෂ දරිද්‍රතාව දුරුලීමට සහ ආර්ථික විෂමතා අඩු කිරීමට ආර්ථික වෘද්ධිය අවශ්‍ය නමුදු එය ප්‍රමාණවත් කොන්දේසියක් නොවේ." ශ්‍රී ලංකාවේ අත්දැකීම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෙම තර්කයෙහි වලංගුතාවය පරීක්ෂා කරන්න. *(ලකුණු 07 යි.)*

6. (අ) 1977 ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වලින් පසුව ශ්‍රී ලංකාවේ නිෂ්පාදන හා අපනයන ව්‍යුහයන්හි හටගෙන ඇති ප්‍රධාන වෙනස්කම් මොනවා ද? *(ලකුණු 04 යි.)*

(ආ) මෑත වර්ෂවලදී ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික ක්ෂේත්‍රයන්හි දක්නට ලැබෙන ශ්‍රම ඵලදායිතාවේ වෙනස්කම් සංසන්දනය කරන්න. *(ලකුණු 05 යි.)*

(ඉ) පහත සඳහන් දෑ ආර්ථික වෘද්ධියට බලපානුයේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(i) තාක්ෂණයේ වර්ධනය (ii) ශ්‍රම ඵලදායිතාව (iii) ප්‍රාග්ධන සමුච්චය *(ලකුණු 06 යි.)*

7. (අ) ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධනය සඳහා බලපාන ප්‍රධාන බාධක කවරේ ද? *(ලකුණු 05 යි.)*

(ආ) ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රාදේශීය විෂමතා වැඩිවීමට බලපාන සාධක හඳුන්වන්න. *(ලකුණු 05 යි.)*

(ඉ) මෑත වර්ෂවල දී ශ්‍රී ලංකා රජය ප්‍රාදේශීය විෂමතා අඩු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේ ද? *(ලකුණු 05 යි.)*

8. (අ) "සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ" යන්නෙන් කුමක් අදහස් වේ ද? *(ලකුණු 04 යි.)*

(ආ) සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සහ මානව සංවර්ධනය අතර ඇති සම්බන්ධතාවය කුමක් ද? *(ලකුණු 05 යි.)*

(ඉ) සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ලා ශ්‍රී ලංකා රජය විසින් මෙතෙක් ලබා ඇති ප්‍රගතිය අගයන්න. *(ලකුණු 06 යි.)*

* * *

www.pastpaperlk.com
www.artsapi.lk